# පාන් කැබැල්ල ට වූ දේ.........



පී. යෙනුමි නෙහන්සා රූපසිංහ

# පාන් කැබැල්ලට වූ දේ ..

**යෙනුම් නෙහංසා රූපසිංහ**

**ප්‍රථම මුද්‍රණය** : *2023*
**කර්තෘ** : *යෙනුම් නෙහාන්සා රූපසිංහ*
**ලිපිනය** : *නො. 227 ,*
*රජ පිහිල්ල මාවත ,*
*මහනුවර*
**ISBN** : *978-624-206-948-7*
**ප්‍රකාශිත දිනය** : *2023. 11. 15*

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

මාගේ සෙවනැල්ල ලෙසින් පිටුපසින් සිටිමින්

නිතරම මා දිරිමත් කරන

මාගේ අම්මාටත්, තාත්තාටත් ,අත්තම්මා, අත්තා සහ මල්ලිටත් ,

මා හට නිතරම මග පෙන්වමින්, මා නිසි මගට යොමු කරන,

මාගේ දයාබර ගුරු මෑණියන් වන,

සමන්මලී ගුරුතුමිය ටත්

ඉතා සෙනෙහසින් පුදමි.

CS CamScanner

# ස්තූතිය

මෙම පොත් පිංච නිර්මාණය කිරීමට

මා හට නන් අයුරින් සහය දැක්වූ

සැමදෙනාටම

මාගේ ගෞරවනීය ස්තූතිය පුදමි....

CamScanner

# අද 2023 සැප්තැම්බර් 16


අද අපේ ගෙදරට පාන් ගෙනාවා. ඒවා හරිම සුවදයි. පාන් ගෙඩිය හරිම මෘදුයි. හරියට පුලුන් වගෙයි. ඇතුල සුදු පාටයි. වටේ දුඹුරු පාටයි. අද අපි රෑට පාන් කැවා. ඒවා හරිම රසයි.



අද 2023 සැප්තැම්බර් 17

ඊයෙ අපි කාපු පාන් වලින් පෙති දෙකක් විතර ඉතුරු වුණා. මට අපේ පරිසරය පාඩමේ 'ආහාර නරක් වීම' කියන පාඩම මතක් වුණා ... ඉතින් මම ඒ ඉතිරි පාන් පෙති නිරීක්ෂණය කරන්න ඕනේ කියල හිතුනා .

අද ඒ පාන් පෙති ටිකක්  වියළි ගතියයි. සුවඳ නම් ඒ වගේම තමයි. රස වෙනසක් නෑ.



අද 2023 සැප්තැම්බර් 18

ඉතිරි වුනු පාන් පෙති මම නිරීක්ෂණය කළා. අද තවත් ටිකක් වේළිලා තිබුණා. හොඳ සුවඳ චුට්ටක් අඩුවෙලා ගිහින්. හැබැයි පාට නම් වෙනසක් නෑ.






CamScanner

**අද 2023 සැප්තැම්බර් 19**

ඉතිරි වුනු පාන් පෙත්තෙන් අද අමුතු සුවඳක් එනවා. හොඳටම වියළි ගතිය යි. පාටත් ටිකක් ලා කහ පාටට හැරිලා. කන්න නම් බෑ වගේ.





CamScanner

අද 2023 සැප්තැම්බර් 20

අද පාන් පෙත්තෙන් ටිකක් සැර ගඳක් දැණුනා.. එක තැනක අළු පාටින් පුස් වගේ හැදිලා. එතන ටිකක් තෙත ගතිය යි. නිරීක්ෂණයට පාන් පෙත්ත අරගෙන තිබ්බා.



අද **2023** සැප්තැම්බර් **21**

අද නම් පාන් පෙත්තේ ගඳ වැඩි වෙලා. එක පැත්තක්ම අළු පාට පුස් වලින් වැහිලා. තැනින් තැන කහපාට පුස් හැදිලා.



අද 2023 සැප්තැම්බර් 22

අද මම පාන් පෙත්ත නිරීක්ෂණය කරන විට එය අළු පාට සහ කහ පාට පුස් වලින් වැහිල තිබුණා. තැන තැන රතුපාටටත් පුස් හැදිලා. හොඳටම ගඳයි.



අද 2023 සැප්තැම්බර් 23

අදත් පාන් පෙත්ත කලින් දවස වගේමයි. හොඳටම ගඳයි. පුස් පිරිලා. අම්මා කිව්වා මේ පුස් කියන්නේ දිලීර වර්ගයක් කියලා. ඒවා අපිට ගොඩක් විෂ සහිතයි කියලා කිව්වා. ඒවා අපට නොදැනුවත්ව ශරීරයට ඇතුල් වුණොත්, අපට තද බඩේ අමාරු, වමනය, පාචනය වගේ ලෙඩ රෝග වගේම සමහර විට මරණයට පවා පත් වෙන්නත් පුළුවන් කියලා අම්මා කිව්වා.



# නිගමනය

අප ගන්නා ආහාර සාමාන්‍ය පරිසර තත්ත්ව යටතේ දී ඉක්මනින් නරක් වීමට පත්වන බවත්, ඒවායේ විෂ සහිත දිලීර වර්ග ආදිය සෑදිය හැකි බවත්, මා මෙයින් ඉගෙන ගතිමි...



CamScanner

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම සහ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය නිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .



මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

CamScanner